# සඳකඩ පහණ

- සඳකඩ පහණ යනු කුමක් දැ යි හඳුන්වන්න.
- අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය තෙක් සඳකඩ පහණේ විකාශය විස්තර කරන්න.
- සඳකඩ පහණේ කැටයම්වල විවිධ අදහස් හා මතවාද ලියා දක්වන්න.
- සඳකඩ පහණේ රූපයක් ඇඳ එහි නිරූපිත අංග නම් කරන්න.

**කියවීම් පත්‍රිකාව**

- පූජනීය ස්ථානයකට පිවිසෙන පඩිපෙළ පාමුල පිහිටි අර්ධ කවාකාර කැටයම් පුවරුව සඳකඩ පහණ නමින් හැඳින්වේ.
- ඉරහඳ ගල, අඩ්ඩජන්න පාෂාණ (අඩසඳ පහණ), පාටිකා යන නම්වලින් ද සඳකඩ පහණ හඳුන්වනු ලබයි.
- ආරම්භයේ දී හතරැස් ගල් පුවරුවක් වූ මෙය අනුරාධපුර, පොළොන්නරු යුගවල අර්ධකවාකාර හැඩය දක්වා වර්ධනය වීමත්, මහනුවර යුගයේ දී ත්‍රිකෝණාකාර හැඩයක් දක්වා වෙනස් වීමත් දැකිය හැක.
- මුල් අවස්ථාවේ කැටයම් රහිත වූ සඳකඩ පහණ ක්‍රමික ව විවිධ කැටයම් එකතු වී අගනා නිර්මාණයක් බවට පත් වීම සිදු වේ.
- අර්ධ වෘත්තාකාර හැඩය තීරු පහකින් යුතු වූ කැටයම් නිර්මාණය වීම හා මෙම එක් එක් තීරුවෙන් නිරූපිත කැටයම් මඟින් ප්‍රකාශිත අර්ථ, මහාචාර්ය සෙනරත් පරණවිතානට අනුව පහත වගුවෙන් දැක්වේ.

| තීරුව | නෙළා ඇති කැටයම | සංකේතාත්මක අර්ථය |
|---|---|---|
| පළමු | ගිනිදැල්ල | තෘෂ්ණාව ආශාව රාග ගින්න |
| දෙවන | සත්ත්වාවලිය (ඇත්, අස්, සිංහ, ගව) | ජාති ජරා ව්‍යාධි මරන |
| තෙවන | සංකීර්ණ ලියවැල | තෘෂ්ණාවේ වෙළීම |
| සිවුවන | හංසාවලිය | සත්‍යාවබෝධය කරා යන ගමන |
| පස්වන | සරල ලියවැල් | බැඳීම්වලින් ලිහිල් වීම |
| හයවන | අඩ නෙළුම | නිවන |

**විවිධ අවධි අනුව කලාත්මක අතින් උසස් සඳකඩපහන නිර්මාණ**

**අනුරාධපුර යුගය**

- අනුරාධපුර බිසෝ මාළිගයේ (මහසෙන් මාළිගයේ) සඳකඩ පහණ

**පොළොන්නරුව යුගය**

- පොළොන්නරුව වටදාගෙයි සඳකඩ පහණ

මහනුවර යුගය

- මහනුවර දළදා මාළිගයේ සඳකඩ පහණ



අනුරාධපුර බිසෝ මාළිගයේ සඳකඩපහණ



පොළොන්නරුව වටදාගෙයි සඳකඩ පහණ



මහනුවර දළදා මාළිගයේ සඳකඩ පහණ

# මුරගල, කොරවක්ගල, පියගැට පෙළ

- ඓතිහාසික වාස්තුවිද්‍යා නිර්මාණ ආශ්‍රිත ව මුරගල, කොරවක්ගල හා පියගැටපෙළ නිර්මාණවල මාධ්‍ය හා ශිල්පක්‍රම ලියා දක්වන්න.

- මුරගල, කොරවක්ගල, පියගැට පෙළ යන නිර්මාණ වල ඇති කලාත්මක අංග විස්තර කරන්න..

- පහත සඳහන් කරුණු ඇතුළත් වන පරිදි මුරගල කොරවක් ගල පියගැටපෙළ පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් පිළියෙළ කරන්න.

  1. මුරගල, කොරවක් ගල, පියගැට නිර්මාණය සඳහා භාවිත කළ මාධ්‍ය
  2. යොදාගත් විවිධ කැටයම්
  3. නිර්මාණය කර ඇති ස්ථාන
  4. කලාත්මත වටිනාකම

# මුරගල

- පූජනීය ස්ථානයකට පිවිසෙන පඩි පෙළ පාමුල සඳකඩ පහණට දෙපසින් ඇති කැටයම් සහිත ගල් පුවරුව මුරගල නමින් හැඳින්වේ.
- කොරවක් ගල සඳහා ආධාරකයක් ලෙසත් පියගැට පෙළෙහි සවි ශක්තිය උදෙසාත් මුරගල යොදාගෙන ඇති බව දක්වේ.
- කැටයම් රහිත ගල් පුවරුවක් ලෙස ආරම්භ වූ මුරගල ක්‍රමයෙන් විවිධ කැටයමින් අලංකාර වී ඇත.
    1. කැටයම් රහිත පුවරුව
    2. පුන්කලස සහිත මුරගල
    3. බහිරව රූව සහිත මුරගල
    4. නාග රූව සහිත මුරගල
    5. නා රජු සහිත මුරගල

- අනුරාධපුර යුගයේ විවිධ කැටයම් සහිත ව විකාශනය වූ මුරගල පසු ව එම කැටයම් සියල්ල සංකලනය කරමින් නා රජ රූපය සහිත ව ඉතා උසස් කලා ලක්ෂණ සහිත ව නිර්මාණය වීම සිදු වී ඇත.
- විවිධ අවස්ථාවල මුරගල කළුගල්, ගඩොළු හා බදාම යන මාධ්‍ය එක්කර නිර්මාණය කර ඇත.

**විවිධ අවධි අනුව කලාත්මක අතින් උසස් මුරගල් නිර්මාණ**

**අනුරාධපුර යුගය**

රත්නප්‍රාසාදයේ මුරගල

**පොළොන්නරු යුගය**

පොළොන්නරු වටදාගෙයි මුරගල



අනුරාධපුරයේ රත්න ප්‍රාසාද මුරගල



පොළොන්නරුවේ වටදාගෙයි මුරගල

**කොරවක් ගල**

- පූජනීය ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට පිවිසෙන පඩි පෙළ දෙපස අත්වැලක් සේ යෙදූ සුවිසල් ගල් පුවරු දෙක කොරවක් ගල නමින් හැඳින්වේ.
- කොරවක් ගල, මකර කටකින් විහිදී ගිය ඇත් සොඬක්, දිය රලක්, ගිනිසිළුවක් ආකාරයෙන් නිමවා ඇත.
- මකර කට තුළින් විහිදී යන රිද්මානුකූල දිය රැල්ලක (ඇත් සොඬ - ගිනිසිළුව) සියුම් ව කැටයම් කර ඇති අයුරින් අගනා කලා නිර්මාණයක් බවට පත් ව ඇත.
- කොරවක්ගලේ කැටයම් සඳහා සිංහ රූප, මකර රූප, ගජසිංහ රූප, කාන්තා රූප යනාදිය භාවිත කර ඇත.
- අනුරාධපුර, පොළොන්නරු යුගවල දී කළුගලින් නිර්මිත කොරවක් ගල ගම්පොළ මහනුවර යුගවල දී ගඩොළු බදාම භාවිතයෙන් නිමවා ඇත.
- අනුරාධපුර, පොළොන්නරු යුගවල දී කොරවක් ගලින් මකර සංකල්පය නිරූපණය වූ අතර මහනුවර, ගම්පොළ යුගවල දී ගජසිංහ සංකල්පයට හැරුණු බවක් පෙනේ.
- පඩි පෙළේ පඩි ප්‍රමාණයට ගැළපෙන පරිදි කොරවක් ගලේ දිග පළල තීරණය විය.

**විවිධ අවධි අනුව කලාත්මක අතින් උසස් කොරවක් ගල් නිර්මාණ**

**අනුරාධපුර යුගය**

- රත්නප්‍රාසාදයේ කොරවක් ගල

**පොළොන්නරු යුගය**

- පොළොන්නරු වටදා ගේ කොරවක් ගල්

**ගම්පොළ යුගය**

- ගඩලාදෙණිය විහාරයේ කොරවක් ගල



රත්නප්‍රාසාදයේ කොරවක් ගල



පොළොන්නරු වටදා ගේ කොරවක් ගල



ගඩලාදෙණිය විහාරයේ කොරවක් ගල

## පියගැට පෙළ

- පහළ මළුවකින් ඉහළ මළුවකට නැඟීම සඳහා ඇති මාර්ගයක ඇති අවශ්‍ය ම අංගය පඩි පෙළ හෙවත් පියගැට පෙළ යි.
- සඳකඩ පහණ, මුරගල, කොරවක් ගල, යන අංග එකිනෙකින් සම්බන්ධ කරන අංගයක් වශයෙන් පියගැට පෙළ හඳුන්වා දිය හැකි ය.
- මුල්කාලීන ව කැටයම් රහිත ව නිර්මාණය වූ පියගැට පෙළ පසු ව විසිතුරු මෝස්තරවලින් අලංකාර විය.
- පඩි පෙළ නැඟීමට සඳකඩ පහණ වෙත පැමිණෙන්නකුට පියගැටවල ඉදිරිපස මැනවින් දර්ශනය වේ. එම නිසා එම ඉඩකඩ කැටයම් සඳහා භාවිත කොට තිබේ.
- වාමන රූප, වජ්‍ර සංකේත, පළාපෙති, ලියවැල් ආදිය පියගැට පෙළ අලංකාරයට යොදා ගෙන ඇත.
- අනුරාධපුර බිසෝ මාළිගයේ පියගැට පෙළ වජ්‍ර හා වාමන රූපවලින් සරසා තිබේ.
- පොළොන්නරු වටදාගෙයි පියගැට පෙළ සමීප පෙළට සිටින වාමන රූප රාශියක් දක්නට ලැබේ.
- විෂ්ණු දේවාලයයේ පියගැට පෙළ විවිධ ලියවැල් මල් මෝස්තරවලින් අලංකාර කර තිබේ.
- ශ්‍රී ලංකාවේ තිබෙන මෙම විශිෂ්ට කැටයම් සහිත පියගැට පෙළ සහිත නිර්මාණ කළුගල් මාධයෙන් නිම කර ඇත.



අනුරාධපුර බිසෝ මාළිගයේ පිටගැට පෙළ



පොළොන්නරු වටදාගෙයි පියගැට පෙළ



මහනුවර විෂ්ණු දේවාලයයේ පියගැට පෙළ